# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1888/2 - 2014 නොවැම්බර් මස 10 වැනි සඳුදා - 2014.11.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත

1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනත මගින් සංශෝධිත 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 වැනි වගන්තිය යටතේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ඒ. එල්. එම්. අතාඋල්ලා වන මා විසින් සාදන ලද නියෝග මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. එල්. එම්. අතාඋල්ලා (පා. ම),
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2014 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග "පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (මනාපය පළ කිරීමට ඉඩදීම) නියෝග " යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2005 ඔක්තෝබර් 25 වැනි දින අංක 1416/9 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1986 පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග ක්‍රියාත්මක වන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයට පෙර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක පත්වීමක් ලැබ ඇති සේවයේ සාමාජිකාවන්ට මේ නියෝග අදාළ විය යුතු ය.

3. නියමිත දිනය වන විට ද සේවයේ නියුක්තව සිටි හා අරමුදලට දායකවීම සඳහා ස්වකීය මනාපය පළ කිරීමට නොහැකි වූ සේවයේ කිසියම් සාමාජිකාවකට -

   (අ) මේ නියෝග ගැසට් පත්‍රයේ පළකළ දිනට පසුව අරමුදලට දායකවීමට ස්වකීය මනාපය පළකළ හැකිය.

   (ආ) මෙසේ අරමුදලට දායකවීමට මනාපය පළකළ හැකි අවසාන දිනය 2014.12.31 වැනි දින විය යුතු ය.

4 (1) 2 වන නියෝගය අදාළ වන සේවයේ කිසියම් සාමාජිකාවක් නියමිත දිනය සහ 2014 දෙසැම්බර් මස 31 වැනි දින යන අතරතුර කාලයේ දී අරමුදලට දායකවීම සඳහා මනාපය පළ කිරීමට නොහැකිව මියගියේ නම්, ඇගේ කලත්‍රයා විසින් වලංගු කාලය තුළ දී ඒ සඳහා මනාපය පළ කළ යුතු ය.

1A - PG 2243— 500 (2014/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) 4(1) වන නියෝගය අදාළ වන සේවයේ සාමාජිකාවක් මියගිය දිනයට පසු දින සිට, 5(2) වන නියෝගයේ විධිවිධාන වලට යටත්ව ඇයගේ වැන්දඹු පුරුෂයා හා/හෝ අනත්දරුවා හා/හෝ අනත්දරුවන් 1986 පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝගවල විධිවිධාන වලට අනුකූලවනතාක් දුරට අර්ථලාභියකු හා/හෝ අර්ථලාභීන් සේ සලකනු ලැබිය යුතු ය.

5. (1) 3 වන නියෝගය ප්‍රකාර අරමුදලට දායකවීමට මනාපය පළ කළ සේවයේ සෑම සාමාජිකාවක්ම, මුල් පත්වීමේ දින සිට මනාපය පළ කළ දිනය දක්වා වන හිඟ දායක මුදල් සහ ඊට අදාළ පොළිය එකවර අරමුදලට ගෙවිය යුතු ය.

(2) 4(1) වන නියෝගය අදාළ වන සේවයේ සාමාජිකාවකගෙන්, නියමිත දිනයේ සිට ඇය අවසන් වරට සේවයේ යෙදුනු දිනය වශයෙන් සලකන ලද දිනය දක්වා වන හිඟ දායක මුදල් සහ ඊට අදාළ පොළිය එකී සාමාජිකාවගේ වැන්දඹු පුරුෂයා හා/හෝ අනත්දරුවා හා/හෝ අනත්දරුවන් විසින් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

6. 5 වන නියෝගයේ සඳහන් හිඟ දායක මුදල් ගණනය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2008ට අනුකූල විය යුතු ය.

11-696

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.